December 2022

# 2 ප්‍රීතිමත් වැඩිහිටියන් සඳහා පුවත් පත්‍රිකාව

## වැඩිහිටි ඒකකය සහ සහන සත්කාර ඒකකය, දකුණු කොළඹ ශික්ෂණ රෝහල



## පසුබිම: ගැටළු හඳුනාගැනීම

ශ්‍රී ලංකාව ලෝකයේ වේගයෙන්ම වයස්ගත ජනගහනය අධික වෙමින් පවතින රටක් වේ. 2012 දී වයස අවුරුදු 60 ට වැඩි ජනතාව සමස්ත ජනගහනයෙන් 12.4% ක් සිටි අතර, දකුණු ආසියාවේ වැඩිම වැඩිහිටි ප්‍රතිශතයක් සිටින රට බවට ද පත්වී ඇත. 2040 වන විට වැඩිහිටි ජනතාව සමස්ත ජනගහනයෙන් 25% කට ආසන්න ප්‍රමාණයක් සිටිනු ඇතැයි ගණන් බලා ඇත.

මීට අමතරව, ශික්ෂණ රෝහල් කිහිපයක සායන සහ අපේක්ෂා රෝහලේ එක් ඒකකයක් හැරුණු විට, සහන සත්කාරය සඳහා විශේෂයෙන් මාරාන්තික නොවන රෝගවලට සහන සත්කාර කිරීම් සඳහා රට තුළ සායන ඒකක හිඟයක් පවතී. එබැවින්, මෙම වයෝවෘද්ධ හා රෝග නිවාරණ ඒකකය පිහිටුවීම 2018 දී සංකල්පගත කරන ලදී.

## ඒකකය පිහිටුවීම

**2018 -** ආරම්භයේදී දකුණු කොළඹ ශික්ෂණ රෝහල හි වයෝවෘද්ධ වෛද්‍ය සේවාව 2018 දී ස්වේච්ඡා සේවයක් ලෙස සතියකට වරක් පවත්වන සායනයක් ලෙස ආරම්භ කරන ලද අතර, පසුව එය වර්තමාන තත්ත්වය දක්වා පහත පරිදි සංවර්ධනය විය.

**2018 -** රෝහලේ අධ්‍යක්ෂවරයාගේ සහාය ඇතිව ස්වේච්ඡා සේවයක් ලෙස සතියකට වරක් සායනය පැවැත්විණ. නේවාසික කායික රෝග විශේෂඥ වෛද්‍යවරයෙකු, වයෝවෘද්ධ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් සහිත ස්වේච්ඡා වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු, භෞතචිකිත්සකවරයකු සහ සේවා නිළධාරියෙකු සමගින් එය ආරම්භ විය. රෝහල තුළින්ම යොමු කිරීම් දක්නට ලැබුණු අතර ප්‍රජාව තුළ සායන කිහිපයක් පවත්වන ලදී.

**2019 සැප්තැම්බර් -** සෞඛ්‍ය අමාත්‍යාංශයෙන් වයෝවෘද්ධ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාවක් ඇති වෛද්‍ය නිලධාරීන් 2 ක් සහ සහන සත්කාර සේවය පිළිබඳ ඩිප්ලෝමාවක් ඇති වෛද්‍ය නිලධාරීන් 1 ක් මෙම ඒකකයට පත් කරන ලදී.

**2020 ජනවාරි -** වෛද්‍යවරුන්ගේ ප්‍රයෝජනයට නොගත් නිල නිවාස ප්‍රදේශයක වැඩිහිටි සහ සහන සත්කාර ඒකකය විවෘත කරන ලදී. දෛනික සායන ආරම්භ කරන ලද අතර විවිධ රෝහල් ඒකකවලින් වයෝවෘද්ධ හා සහන සත්කාර සේවය සඳහා රෝගීන් යොමු කිරීම් දක්නට ලැබුණි. තවද, මාසිකව, ක්ෂේත්‍ර වැඩිහිටි සායනයන් සංවිධානය කරන ලදී.

**2020 ජූනි -** වෛද්‍ය පශ්චාත් උපාධි ආයතනයේ නිර්දේශයෙන් පසුව, වයෝවෘද්ධ වෛද්‍ය විද්‍යාව සඳහා පුහුණු ඒකකයක් ලෙස නම් ලදී. ඉන් අනතුරුව, හදිසි අනතුරු සේවා සහ විකලාංග වාට්ටු වෙත වැටීම් සහ අස්ථි බිඳීම් හේතුවෙන් ඇතුළත් වූ වැඩිහිටියන්ට ප්‍රතිකාර ලබාදීම සඳහා ද සේවාවන් පුළුල් කරන ලදී.

## වත්මන් තත්ත්වය

රෝහලේ පවතින පහසුකම් සහ ස්වේච්ඡාසේවකයන්ගේ පරිත්‍යාග යොදාගනිමින් ඒකකයේ යටිතල පහසුකම් සංවර්ධනය කර ඇත. මේ වන විට වයෝවෘද්ධ වෛද්‍ය විද්‍යාව පිළිබඳ ඩිප්ලෝමාව ඇති වෛද්‍ය නිලධාරීන් 3 දෙනෙකු ද, සහන සත්කාර සේවා ඩිප්ලෝමාව සහිත එක් වෛද්‍ය නිලධාරියකු ද, භෞත චිකිත්සකවරයකු ද, පුහුණු රෙජිස්ට්‍රාර්වරුන් ද, වයෝවෘද්ධ වෛද්‍ය විද්‍යාවේ ජ්‍යෙෂ්ඨ රෙජිස්ට්‍රාර්වරුන් ද, නේවාසික කායික රෝග විශේෂඥ වෛද්‍යවරයකුගේ අධීක්ෂණය යටතේ සේවය සපයයි. තවදුරටත් මූලික උපකරණ කිහිපයක් සහිත කුඩා භෞත චිකිත්සක කාමරයක් ද ඒකකය මගින් පවත්වාගෙන යනු ලැබේ.







## දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ වැඩිහිටි සත්කාර ඒකකයෙන් සපයනු ලබන සවිස්තරාත්මක ක්‍රියාකාරකම්/සේවා



## ✔ ඉහත සේවාවන් සඳහා රෝගීන් බඳවා ගැනීම සඳහා මූලික නිර්ණායක

- ✓ වයස අවුරුදු 60 ට වැඩි හෝ
- ✓ අබල දුබල තත්වයන් සහිත සහ එහි සංකූලතා සහිතව සහනයට යොමු කෙරුණු රෝගීන් (උදා: වැටීම්/ අස්ථාවරත්වය, එකතැන්වීම්, ඩිමෙන්ෂියාව, මුත්‍රා ඉබේ කාන්දු වීම් ආදිය)

බාහිරව හෝ අභ්‍යන්තරව රෝගීන් යොමු කිරීම්වලදී සහ ප්‍රජා මූලික සේවා අතරතුර හඳුනාගෙන ඇති රෝගීන්ට සේවා සපයනු ලැබේ.

## ඒකකය මගින් සිදුකරනු ලබන සමීක්ෂණයකට අනුව හඳුනාගෙන ඇත්තේ...

- සාමාන්‍යයෙන් ලියාපදිංචිය සඳහා ඒකකයට පැමිණෙන රෝගීන්ගෙන් 94% ක් එම දිනයේදීම පරීක්ෂා කරනු ලබන අතර, රෝගීන්ගෙන් 3% ක් එම සතිය තුළම දක්නට ලැබේ. 3% ක ප්‍රමාදයක් සිදුවන්නේ රෝගීන්ගේ පෞද්ගලික ඉල්ලීම් අනුවයි .
- පරීක්ෂා දිනය තුළ සාමාන්‍ය පොරොත්තු කාලය විනාඩි 4.36ක් තරම් අඩුය.
- පළමු රෝගී පරීක්ෂාවේදී එක් පුද්ගලයෙකුට ලැබෙන සාමාන්‍ය උපදේශන කාලය විනාඩි 75.45 කි.
- දෙවන සහ ඊළඟ රෝගී පරීක්ෂා කිරීම් වලදී එක් පුද්ගලයෙකුට ලැබෙන සාමාන්‍ය උපදේශන කාලය විනාඩි 24.40 කි.
- සමීක්ෂණය අතරතුර, බොහෝ රෝගීන් පවසන පරිදි ඉහත සඳහන් වටිනා ගුණාංග ඔවුන් කිසි විටෙකත් වෙනත් තැනක අත්විඳ නැති බවයි.



භෞත චිකිත්සක කාමරයේදී , ඇවිදීමේ අස්ථාවරත්වය සහිත රෝගියෙකු සඳහා පවත්වන භෞත චිකිත්සක සැසිය

## රෝගියෙකුගේ අදහස් දැක්වීමක්...



# ප්‍රජාව තුළ වැඩිහිටි සේවයේ ධාරිතාව වැඩි දියුණු කිරීම සඳහා වූ JICA ව්‍යාපෘතිය

## ✔ කෝට්ටේ පැවැත්වූ, ප්‍රජාවෛද්‍ය සායනයකට උදාහරණයක්

ඡායාරූප අදාළ පුද්ගලයන්ගේ අවසර ඇතිව ප්‍රකාශයට පත් කෙරේ

- වයස අවුරුදු 60 සහ ඊට වැඩි රෝගීන් සඳහා සේවය සපයනු ලැබේ.
- දකුණු කොළඹ ශික්ෂණ රෝහලේ වැඩිහිටි හා සහන සත්කාර ඒකකයේ වෘත්තීය කාර්ය මණ්ඩලය මගින් ස්වේච්ඡා කටයුත්තක් ලෙස මෙවැනි සායන පවත්වනු ලැබේ .
- වැඩිහිටි කමිටු හෝ වෙනත් ප්‍රජා කණ්ඩායම්වල ඉල්ලීම් මත පදනම්ව ඒකකය ප්‍රජාවන් වෙත පැමිණේ.

**ප්‍රජාව තුළ සංවිධානය කිරීම වැඩිහිටි කමිටුව මගිනි**



(1) වෛද්‍ය සායනයට ලියාපදිංචි වීම



(2) සහභාගිවන්නන්ගේ තොරතුරු වාර්තාකිරීම



(3) උස සහ බර මැනීම



(4) පෙනීම + ශ්‍රවණ පරීක්ෂාව



(5) රෝගියාගේ ක්‍රියාකාරී මට්ටම පරීක්ෂාව



(6) රුධිර සීනි පරීක්ෂාව



(7) රෝගී පරීක්ෂාව



(8) භෞත චිකිත්සාව



(9) විනෝදාස්වාදය



## ක්ෂේත්‍රයෙන් පණිවිඩ



මෙම සායන සායනය ගැන අපි ඉතාමත්ම සතුටු වෙමු. ගමේ සමහර වැඩිහිටි අයට මේ වගේ සෞඛ්‍ය පරීක්ෂණයක් පෞද්ගලිකව කරන්න යන වියදම වැඩියි. අපගේ සෞඛ්‍ය තත්ත්වය පරීක්ෂා කර ගැනීමට මෙවැනි නොමිලේ සායනයක් ඉතා අගනේය.- ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්

සමහර වැඩිහිටියන්ට බාහිර රෝහල්වලට යාමට තම භාරකරුවන්ගේ හෝ දරුවන්ගේ සහාය අවශ්‍ය වේ, නමුත් සමහර විට ළමයින් ඔවුන්ගේ රැකියාවල කාර්යබහුල වන අතර එය දුෂ්කර වේ. මෙම සායන පයින් යා හැකි දුරින් ඇති බැවින් ඔවුන්ට තනිවම සහභාගී විය හැකිය. - ජ්‍යෙෂ්ඨ පුරවැසියෙක්

## අභියෝග

- ✔ ඒකකය පුළුල් කිරීමට රාජ්‍ය අනුග්‍රහය වඩ වඩාත් අවශ්‍ය වේ.
- ✔ විශේෂ වැඩිහිටි වාට්ටු සහ අතරමැදි සත්කාර පහසුකම් නොමැතිකම
- ✔ වැඩිහිටි වෛද්‍ය ඒකකයක නිත්‍ය වශයෙන් සිටිය යුතු වෘත්තීය සාමාජිකයන්ගේ දැනට පවතින හිඟය.

**කරුණාකර ඔබේ ප්‍රජාව තුළ සිදු වන යහපත් ක්‍රියාකාරකම් jicaceecs@gmail.com වෙත යවන්න**

තරුණ, වැඩිහිටි සහ ආබාධිත අධ්‍යක්ෂක මණ්ඩලය, සෞඛ්‍ය අමාත්‍යාංශය
ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය, කාන්තා,ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය
ජපන් ජාත්‍යන්තර සහයෝගිතා නියෝජිතායතනයේ (JICA) ප්‍රජාව තුළ වැඩිහිටි සේවයේ ධාරිතාව වැඩි දියුණු කිරීමේ ව්‍යාපෘතිය

Ministry of Health

**ව්‍යාපෘති කාර්යාලය**
**ජාතික වැඩිහිටි මහලේකම් කාර්යාලය (NSE),**
**ලිපිනය: D බ්ලොක්, 2 වන මහල, සෙත්සිරිපාය අදියර (II), බත්තරමුල්ල, කොළඹ**
**විද්‍යුත් තැපෑල: jicaceecs@gmail.com**